# බීජ අර්තාපල් ගබඩා කිරීමේ තත්ත්වයන් සහ ශ්‍රී ලංකාවේ භාවිතා වන ගබඩා ක්‍රම

උසස් තත්ත්වයේ බීජ අර්තාපල් යොදා ගැනීම අර්තාපල් වගාවේ වැදගත්ම සාධකයයි. මෙහි දී රෝග හා පලිබෝධ වලින් තොර සිටුවීමට වඩාත් සුදුසු මට්ටමට වැඩුණු අංකුර සහිත බීජ අර්තාපල් ලබා ගැනීම සඳහා මනාව පාලනය කළ ගබඩා තත්ත්ව වැදගත් වේ.

## ප්‍රශස්ථ ගබඩා තත්ත්ව

* වායු සංසරණය

මනා වායු සංසරණයක් තුළින් ගබඩාවේ උෂ්ණත්වයේ වෙනස්වීම් අවම වන අතර ගබඩාව තුළ රැඳී කාබන්ඩයොක්සයිඩ් ඉවත් කර ඔක්සිජන් සැපයීම සිදු වේ. එබැවින්, යහපත් වායු සංසරණයක් පැවතීම බීජ අර්තාපල් ගබඩාවක අවශ්‍යතාවයකි.

එසේ වුව ද, අනවශ්‍ය පරිදි වාතාශ්‍රය ලැබීමෙන් බීජ අර්තාපල් වියැලීමට ලක්වන බැවින් දිනකට වරක් පමණ ගබඩාව තුළට නැවුම් වාතය ඇතුළු වීම ප්‍රමාණවත් ය.

බීජ අර්තාපල් වල දූවිලි සහ පස් තැවරී පැවතියහොත් එම බීජ තුළට ඔක්සිජන් ඇතුළු වීම දුර්වල වන නිසා ගබඩා කරන අර්තාපල් පිරිසිදුව තබා ගැනීම ද වැදගත් වේ. වාෂ්පීකරණය මගින් සිදුවන ජල හානිය පිටත පොත්ත: අංකුර: කැපුම් පෘෂ්ඨ 1:100:300 බැවින් ජල හානිය අවම කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු ය.

* හොඳින් මෝරන ලද ආකන්ධ බීජ සඳහා තෝරා ගැනීම
* පලුදු නොවූ නිරෝගී ආකන්ධ වීම
* විශේෂ ගබඩා තත්ත්වයන් යටතේ මතුපිට තෙතමනය ඉවත් කළ ආකන්ධ

අර්තාපල් වල අංකුර වර්ධනය වීමත් සමග ඒකක ක්ෂේත්‍රඵලය වැඩි වීම හා ශ්වසන වේගය ඉහළ යාම නිසා වාෂ්පීකරණය ඉහළ යයි. අවශ්‍ය පරිදි ඔක්සිජන් නො ලැබී යාමෙන් බීජයේ ඇතුලත පටක විනාශ වී Black Heart නම් රෝගී තත්ත්වය ඇතිවිය හැකිය. එබැවින්, බීජ ප්‍රරෝහණය වන අවධියේ දී මනා වාතාශ්‍රයක් සැපයිය යුතු ය.

* අග්‍රස්ථ ප්‍රමුඛතාවය සහ සුප්ත කාලය

එක් අර්තාපල් ආකන්ධයකින් වැඩිම අංකුර සංඛ්‍යාවක් ලබා ගත හැකි හොඳම ක්‍රමය වන්නේ බීජයේ ස්වභාවික සුප්තතාවය හා අග්‍රස්ථ ප්‍රමුඛතාවය අවසන් වන තුරු ගබඩා කර තබා ප්‍රරෝහනය වීමට සැලැස්වීමයි. අසල්වැසියෝ සෙල්සියස් අංශක 5ක් වැනි අඩු උෂ්ණත්වයක දී අර්තාපල් දීර්ඝ කාලයක් ගබඩා කල හැකි ය.

* උෂ්ණත්වය

ශීත ගබඩා තුළ බීජ සෙල්සියස් අංශක 15කට වැඩි උෂ්ණත්වයක් දක්වා ඉහළ නැංවීමෙන් ප්‍රරෝහ වර්ධනය වේගවත් වී වැඩි අංකුර සංඛ්‍යාවක් ද ලබා ගත හැකි වේ. සෙල්සියස් අංශක 10-15 උෂ්ණත්වයක මාස 3කට නො වැඩි ගබඩා කාලයක් පවත්වා ගැනීම යෝග්‍ය ය. ශීත ගබඩා තත්ත්වයන් යටතේ ප්‍රශස්ථ උෂ්ණත්වය සෙල්සියස් අංශක 5කි. මාස 10 වැඩි කාලයක් ගබඩා කළ හැකි ය. මෙයට වඩා අඩු හෝ වැඩි උෂ්ණත්ව තත්ත්වන් යටතේ ඔක්සිජන් ඌනතාවයට භාජනය වීමෙන් පටක වලට හානි විය හැකි ය.

* ආලෝකය

විසරිත ආලෝකය ලබා දුන් විට ගබඩා කාලය වැඩි කර ගත හැකි අතර ආලෝකය නිසි පරිදි ලැබීමෙන් දිරිමත් පැලයක් ද ලබාගත හැකි වේ.

* තෙතමනය හා ආර්ද්‍රතාවය

බීජ අර්තාපල් ආකන්ධ මතුපිට වියළී විය යුතු අතර සාපේක්ෂ ආර්ද්‍රතාවය 70%-80% පමණ පවත්වා ගත යුතු ය.

## ගබඩා ක්‍රම

### ලී බන්දේසි

පේළි 2ක් ලෙස මීටර් 1.5-2 ක් උසට එක මත එක ගබඩා කරනු ලැබේ. සෑම බඳුනකම සෙ.මී. 8-9 උසට ගබඩා කරයි. බඳුනේ 1/4 ක් පමණ කොටසක් මනා වාතාශ්‍රයක් සඳහා හිස්ව තැබිය යුතු ය.

### ලී බන්දේසි භාවිතයේ අවාසි

* හැසිරවීම අපහසු ය.
* දිලීර වර්ධනය පහසු ය.
* ශක්තිමත් බවින් අඩු නිසා කල් පැවැත්ම අඩු ය.

### පොලිසැක් මලු

එක් බෑගයකට කිලෝ 25 බීජ අර්තාපල් දමා සෙ.මී. 9 පමණ උසට එක මත එක ගබඩා කරයි.

### ශීත ගබඩා

සීතාඑළිය බීජ නිෂ්පාදන ගොවිපලෙහි බීජ අර්තාපල් ටොන් 25-30 පමණ ගබඩා කළ හැකි ශීත ගබඩා පවතී. මේවා සෙල්සියස් අංශක 4ක උෂ්ණත්වයක් හා සාපේක්ෂ ආර්ද්‍රතාවය 90%-95% යටතේ පවත්වා ගනී.

### සරල ගබඩා

ලී වලින් තනන ලද නිවසක හැඩැති ගබඩා විශේෂයකි. මෙහි කාමර 4-5ක් ඇති අතර විසරිත ආලෝක යටතේ හොඳ වාතාශ්‍රයක් සහිත ව ගබඩා කල හැකි ය. වහලය පිදුරු හෝ විනිවිද පෙනෙන තහඩු වලින් සෙවිලි කරයි. මෙවැනි ගබඩා 1970 - 1980 දශකයේ සිට ගොවීන් අතර ජනප්‍රිය වූ ගබඩා විශේෂයකි.

### බීජ සඳහා අර්තාපල් ගබඩා කිරීම

බීජ සඳහා තෝරා ගත් අල හොඳින් පවනේ වියලා ගත යුතු ය. ඉන්පසු, එම අල ලී බන්දේසි වල බීජ තට්ටු තුනක්, හතරක් වන සේ තැන්පත් කිරීම වඩාත් සුදුසු ය.

### ගබඩා තුළ කෘමි හානි පාලනය

ගබඩා තුළ දී, ඇතිවන අල ඉපියන්ගෙන් වන හානි හා කුඩිත්තන්ගෙන් වන හානි පාලනය කළ යුතු ය. මේ සඳහා නිර්දේශිත කෘමිනාශකයක් භාවිතා කිරීම සුදුසු ය. ගබඩාවේ දොර - ජනෙල් හා වා සිදුරු කෘමි රෝධක දැල් වලින් ආවරණය කළ යුතු ය.


**ඒ.සී.එම්. මයීන්**
*පර්යේෂණ නිලධාරී*
**බී.ජී. අමරසේකර**
*පර්යේෂණ සහකාර*
**සාගරිකා කුමාරි සෙනෙවිරත්න**
*කෘෂිකර්ම උපදේශක*
කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය,
සීතාඑළිය,
නුවරඑළිය.


## ඕසෝන් ස්ථරය රැක ගැනීම

ලොව පුරා අවධානය යොමුව ඇති ප්‍රධාන මාතෘකාවක් වන්නේ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඕසෝන් ස්ථරයට සිදුවන හානියයි. එබැවින්, එකී හානිය අවම කර ගැනීමට හැකි වඩාත් යහපත් ක්‍රියාකාරකම් වෙත යොමුවීම යුගයේ අවශ්‍යතාවයකි. කෘෂිකර්මාන්තයේ දී භාවිතා වන මෙතිල් බ්‍රෝමයිඩ් වෙනුවට ආදේශක ක්‍රම භාවිතය එනම් සමෝධානික පළිබෝධ කළමනාකරණය, සූර්යතාපනය, ඕසෝන් හිතකාමී පළිබෝධ නාශක භාවිතය යනාදිය මෙහි දී වැදගත් වේ.